අප සමාජයේ යම් කාලයක් භාවිතා වූ ඇතැම් හැඳින්වීම් සහ යෙදුම් සමගින් ගැට ගැසී පැමිණෙන කොන් කිරීමේ හෝ පහත හෙළීමේ හැඟීම් සමගින්, එම යෙදුම් භාවිතය හැරදා වඩාත් නිවැරදි යෙදුම් හා හැඳින්වීම් යොදාගැනීමට සිදුවන අවස්ථාවන් තිබේ. මව්බිම පුවත්පතේ "ගොළු යුවළට හා පස් හැවිරිදි පුතාට 5000 අහිමි කරලා" යනුවෙන් වන සිරස්තලය ඊට උදාහරණයකි. ශිෂ්ට සම්පන්න සමාජය තුළ තවදුරටත් "ගොළු" වැනි යෙදුම් යොදා නොගැනේ. කෙසේ වෙතත් පුවතේ අන්තර්ගතය තුළ වඩාත් නිවැරදිව "කථන ආබාධිත" යනුවෙන් සඳහන් කොට තිබේ. එසේ නම් සිරස්තලය තුළද වඩාත් නිවැරදි යෙදුමක් භාවිතා කරන්නට නොහැකි වී ඇත්තේ මන්ද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima**